00124

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩ සටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2010

**ESD2231** – ඉගෙනුම් ඉගැන්වීම් පර්යාලෝකන

කාලය - පැය 03 යි.

---

දිනය - 2010.06.05 වේලාව - ප.ව. 01.30- ප.ව. 04.30

---

පළමු කොටසේ <u>සියළුම</u> ප්‍රශ්නවලටත් දෙවන කොටසේ ඕනෑම ප්‍රශ්න <u>තුනකටත්</u> පිළිතුරු සපයන්න.

<u>I - කොටස</u>

01. 'ඉගෙනුම සංකල්පය' යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි සුදුසු නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

02. 'ඉගෙනුම' යන්න පිළිබඳ ව සලකා බැලිය යුතු ප්‍රධාන සාධක තුන නම් කරන්න.

03. ඉගෙනුම ආරම්භ කිරීමට පෙර ළමයා තුළින් හඳුනා ගත හැකි සාධක තුනක් (03) පැහැදිලි කරන්න.

04. 'ළමයාගේ ක්‍රියාකාරී සහභාගිත්ව' සංකල්පය හා සම්බන්ධ ලක්ෂණ පහක් (05)සඳහන් කරන්න.

05. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදී සිටින පුද්ගලයකු තුළ සංවර්ධනය විය යුතු යහපත් ගුණාංග පහක් (05) සැකෙවින් සාකච්ඡා කරන්න.

06. ඉගෙනුම තුළින් නිර්මාණාත්මක බව ගොඩ නැගිම නිදසුන් දෙමින් විස්තර කරන්න.

07. 2003 දී ජාතික අධ්‍යාපන කොමිසම් සභාව විසින් හඳුන්වා දෙනු ලැබූ මූලික නිපුණතා හත (07) ලැයිස්තු ගත කරන්න.

08. තිලානි 4 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. ඇයට යමක් කියවීමේදී සමහර වචන හඳුනා ගැනීමට අපහසුය. මෙම ගැටළුව විසඳා ගැනීමෙහි ලා ඔබ යෝජනා කරන ඉගැන්වීමේ ආධාරක මොනවාදැයි නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 8 x 5 = 40)

## II කොටස

09. (i) ඔබ ඉගෙන ගත් අධ්‍යාපනික දාර්ශනිකයන් තිදෙනෙක් (03) නම් කරන්න.
(ලකුණු 03)

(ii) මෙම දාර්ශනිකයන් තිදෙනා ඉදිරිපත් කරන ලද පොදු අදහස් තුනක් (03) ලියන්න.
(ලකුණු 03)

(iii) මින් එක් දාර්ශනිකයෙක් තෝරාගෙන ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ අධ්‍යාපන න්‍යාය වර්තමාන ප්‍රාථමික පන්ති කාමර සඳහා ගලපාගන්නේ කෙසේදැයි පරීක්ෂා කරන්න.
(ලකුණු 14)

10. i. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී ඉගැන්වීමේ ආධාරක වැදගත් වන්නේ ඇයි ?
(ලකුණු 06)

ii. ඉගැන්වීමේ ආධාරයක හඳුනාගත හැකි ගුණාංග මොනවාද ?
(ලකුණු 06)

iii. "අප අවට සිටින සතුන්" යන තේමාවෙන් පාඩමක් තෝරාගෙන, ඒ සඳහා සුදුසු ඉගෙනුම් ආධාරක මොනවාදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

11. i. 'ප්‍රීතිමත් ඉගෙනුම' යන සංකල්පයෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 03)

ii. ළමයකුගේ මුල් වයස්වල ප්‍රීතිමත් ඉගෙනුමක ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.
(ලකුණු 05)

iii. පාඩමක් තෝරාගෙන ගුරුවරයෙකු ප්‍රීතිමත් ඉගෙනුම් අවස්ථාවක් නිර්මාණය කළහැකි විවිධ ක්‍රියාකාරකම් කිහිපයක් (අවම වශයෙන් 3 ක්) සැලසුම් කරන්න.
(ලකුණු 12)

12. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් (02) තෝරාගෙන එකිනෙක විස්තරාත්මකව සාකච්ඡා කරන්න.

i. භෞතික ඉගෙනුම් පරිසරය
ii. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා
iii. ප්‍රවේශ නිපුණතා
iv. ඉන්ද්‍රිය ඉගෙනුම (ලකුණු 10 x 2 = 20)

13. (i) "තක්සේරුකිරීම" සහ "ඇගයීම" අතර වෙනස කුමක්ද?

(ලකුණු 06)

(ii) ප්‍රාථමික ශ්‍රේණිවල ළමුන් තක්සේරු කිරීම සඳහා භාවිත කරනු ලබන අවිධිමත් ක්‍රම තුනක් (03) උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(iii) ප්‍රාථමික පන්තිවල ළමුන් තක්සේරු කිරීමේදී විධිමත් ක්‍රම පමණක් නොව අවිධිමත් ක්‍රම ද යොදා ගනියි. උදාහරණ දෙමින් ඊට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 08)

14. (i) 'ස්ව සංකල්පය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 06)

(ii) ස්ව සංකල්පය සහ ආත්ම අභිමානය අතර වෙනස උදාහරණ දෙමින් විස්තර කරන්න.

(ලකුණු 06)

(iii) සමාජ මනෝවිද්‍යාඥයින් දෙදෙනෙකු (02) නම් කර ස්ව සංකල්පය පිළිබඳ ඔවුන්ගේ මත විශ්ලේෂණය කරන්න.

(ලකුණු 08)

- හිමිකම් ඇවිරිණි. -

THE OPEN UNIVERSITY OF SRI LANKA

DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 4

FINAL EXAMINATION – 2010

ESD2231 – PERSPECTIVES IN TEACHING AND LEARNING

**DURATION : THREE (03) HOURS**

| DATE: 05.06.2010 | TIME : 01.30 p.m.-04.30 p.m. |
|---|---|

**Answer all questions in Part I and any three questions from Part II.**

## PART – I

01. What is meant by the "concept of learning"? Explain with suitable examples?

02. Name the three main factors that should be considered with respect to learning.

03. Explain three (03) factors that can be identified in the child before learning commences.

04. State five (05) characteristics related to the concept of child's active participation.

05. Discuss briefly five (05) good qualities that should be developed in the individual involved in the teaching-learning process.

06. Describe generating creativity through learning with examples.

07. List the seven (07) basic competencies introduced by the National Education Commission in 2003.

08. Thilani studies in grade 4. She finds it difficult to identify certain words, when she reads the teaching aids that can be suggested by you to overcome this problem with examples.

(8 x 5 = 40 marks)

## PART – II

09. i. Name three (03) Educational Philosophers you have learned about.
(03 marks)
ii. Write three (03) common views put forward by these three philosophers.
(03 marks)

iii. Select one (01) of those philosophers and examine how his/her educational theory could be adapted to the present day Primary classroom.
(14 marks)

10. i. Why are teaching aids important in the teaching-learning process?
(06 marks)

ii. What are the good qualities that can be identified in a teaching aid.
(06 marks)

iii. The theme is "animal around us" select a lesson from the theme and discuss what suitable teaching aids can be used in the lesson.
(08 marks)

11. i. Explain in brief what is meant by the concept of Joyful Learning.
(03 marks)
ii. Discuss the importance of joyful learning in the early years of child.
(05 marks)
iii. Select a lesson and design several activities (at least 3) that a teacher can use to create a joyful learning situation.
(12 marks)

12. Select two (02) of the topics below and discuss each in detail
i. Physical learning environment
ii. Essential Learning Competencies
iii. Entry competences
iv. Sensory learning

(10 x 2 = 20 marks)

13. i. What is the difference between "Assessment" and "Evaluation"?
(06 marks)
ii. Explain with examples three (03) informal methods used to assess children in Primary grades.
(06 marks)
iii. We use not only formal methods but also informal methods assess. Primary school children substantiate your answer with examples.
(08 marks)

14. i. What is meant by self concept?
(06 marks)
ii. Describe with examples the difference between 'self-concept' and 'self-Esteem'
(06 marks)
iii. Name two (02) social psychologists and analyse their views on 'self-concept'
(08 marks)

*-Copyrights reserved -*